2006.08.08

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 05

රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහන හා සම්බන්ධ
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>රජයේ මැදිහත් වීමෙන් වී මිලදී ගැනීම - ක්‍රමවේදය, උපදෙස් හා ගිණුම් පියවීම</u>

2004 / 2005 මහ කන්නයේ දී, 2005 යල කන්නයේ දී හා 2005 / 2006 මහ කන්නයේ දී රජයේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කරන ලද වී මිලදී ගැනීමේ වැඩ සටහන් සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

1. <u>2004 / 2005 මහ කන්නය</u>

1.1 මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ උපදෙස් එවකට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අංක 4/8/32 හා 2005.02.14 දිනැති චක්‍රලේඛය මගින් ලබා දී ඇත.

1.2 වී මිලට ගත යුතු මිල ගණන්, වී වල ප්‍රමිතිය, පරිපාලන වියදම්, සහල් භාර දිය යුතු ආයතන, සහල් වල මිල ගණන්, සහල් වල ප්‍රමිතිය හා ප්‍රවාහන වියදම් පිළිබඳ උපදෙස් මෙම චක්‍රලේඛයේ සඳහන් වේ.

1.3 මෙම ක්‍රමවේදය යටතේ 2004/2005 මහ කන්නයේ දී ඒ ඒ දිස්ත්‍රික්කයට ලබා දුන් අත්තිකාරම් මුදල ආපසු පියවීම නිවැරදිව ගිණුම්ගත කිරීම සඳහා පහත සඳහන් තොරතුරු නිශ්චිතව හඳුනා ගත යුතුවේ.

- අත්තිකාරම් මුදල එක් එක් මිලදී ගැනීමේ ආයතනයට බෙදා දුන් ආකාරය.
- එක් එක් මිලදී ගැනීමේ ආයතන මිලදී ගත් වී ප්‍රමාණය (වී වර්ග අනුව).
- එම වී වලින් නිෂ්පාදනය කළ සහල් සපයන ලද ආයතන හා සහල් තොග භාර දුන් ස්ථානය.
- භාර දුන් සහල් ප්‍රමාණය (සහල් වර්ග අනුව) හා එම සහල් වල වටිනාකම.
- රජයේ භාර දීමෙන් තොරව සෘජුවම අලෙවි කර ඇති වී හෝ සහල් ප්‍රමාණය හා වටිනාකම
- 2006.07.30 දින වන විට පියවා ඇති අත්තිකාරම් මුදල
- පියවීමට ඉතිරිව ඇති අත්තිකාරම් මුදල

1.4 ඉහත 1.3 හි සඳහන් විස්තර අනුව 2004/2005 මහ කන්නය සඳහා දිස්ත්‍රික්කයට ලබා දුන් අත්තිකාරම් මුදල මෙතෙක් පියවා නොමැති නම් අදාල මිලදී ගැනීමේ ආයතනය මැදිහත් කර ගනිමින් නොපමාව එය පියවීමට පියවර ගත යුතු වේ.

1.5 මෙම කන්න තුල සහල් ප්‍රවාහනය කිරීම ඇතුළු සියලු පරිපාලන වියදම්, වියදම් ස්වරූපය අනුව වර්ගීකරණය කර ඉදිරිපත් කළ යුතුවේ.

2. **2005 යල කන්නය**

2.1 මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ උපදෙස් එවකට කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක 4/12/ හා 2005.08.16 දිනැති චක්‍රලේඛය මගින් ලබා දී ඇත.

2.2 වී මිලට ගත යුතු මිල ගණන්, වී වල ප්‍රමිතිය, පරිපාලන වියදම්, සහල් භාර දිය යුතු ආයතන, සහල් වල මිල ගණන්, සහල් වල ප්‍රමිතිය හා ප්‍රවාහන වියදම් පිළිබඳ උපදෙස් මෙම චක්‍රලේඛයේ සඳහන් වේ.

2.3 මෙයට අමතරව වී හෝ සහල් සෘජුවම අලෙවි කර අත්තිකාරම් පියවීම හා සහල් සමෘද්ධි වැඩසටහනට යෙදවීම මගින් අත්තිකාරම් පියවීම සම්බන්ධයෙන් ද උපදෙස් ලබා දී ඇත.

2.4 මෙම ක්‍රමවේදය යටතේ 2005 යල කන්නයේ දී ඒ ඒ දිස්ත්‍රික්කයට ලබා දුන් අත්තිකාරම් මුදල ආපසු පියවීම නිවැරදිව ගිණුම් ගත කිරීම සඳහා පහත සඳහන් තොරතුරු නිශ්චිතව හඳුනා ගත යුතු වේ.

- අත්තිකාරම් මුදල එක් එක් මිලදී ගැනීමේ ආයතනයට බෙදා දුන් ආකාරය.
- එක් එක් මිලදී ගැනීමේ ආයතන මිලදී ගත් වී ප්‍රමාණය (වී වර්ග අනුව).
- එම වී වලින් නිෂ්පාදනය කළ සහල් සපයන ලද ආයතන හා සහල් තොග භාර දුන් ස්ථානය.
- භාර දුන් සහල් ප්‍රමාණය(සහල් වර්ග අනුව) හා එම සහල් වල වටිනාකම.
- රජයට භාර දීමෙන් තොරව සෘජුවම අලෙවි කර ඇති වී හෝ සහල් ප්‍රමාණය හා වටිනාකම.
- 2006.06.15 දින වන විට පියවා ඇති අත්තිකාරම් මුදල.
- පියවීමට ඉතිරිව ඇති අත්තිකාරම් මුදල

2.5 ඉහත 2.4 හි සඳහන් විස්තර අනුව 2005 යල මහ කන්නය සඳහා දිස්ත්‍රික්කයට ලබා දුන් අත්තිකාරම් මුදල මෙතෙක් පියවා නොමැති නම් අදාළ මිලදී ගැනීමේ ආයතනය මැදිහත් කර ගනිමින් නොපමාව එය පියවීමට පියවර ගත යුතු වේ.

2.6 මෙම කන්න තුල සහල් ප්‍රවාහනය කිරීම ඇතුළු සියලු පරිපාලන වියදම්, වියදම් ස්වරූපය අනුව වර්ගීකරණය කර ඉදිරිපත් කළ යුතුවේ.

3. **2005/2006 මහ කන්නය**

3.1 මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 10-1/1 හා 2006.02.28 දිනැති චක්‍රලේඛය මගින් ලබා දී ඇත.

3.2 වී මිලට ගත යුතු මිල ගණන්, වී වල ප්‍රමිතිය හා පරිපාලන වියදම් පිළිබඳ උපදෙස් මෙම චක්‍රලේඛයේ සඳහන් වේ.

3.3 පසුගිය 2005/2006 මහ කන්නයේදී මිලට ගත් වී සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග:-

- අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, හම්බන්තොට, කුරුණෑගල හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල 2005/2006 මහ කන්නයේ දී මිලට ගත් වී ප්‍රමාණයෙන් 64% ක් සහල් බවට පත් කර, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු ගබඩා වලට ආරක්ෂණ තොගයක් ලෙස සැපයීම.
- සහල් සැපයිය යුතු ගබඩාව පිළිබඳ විස්තර ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ද එකඟතාවය මත වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් සපයනු ලැබේ.

- ආහාර කොමසාරිස් ගබඩා වෙත සපයන සහල් තොග නිවැරදිව භාර ගෙන සුරක්ෂිතව පවත්වා ගෙන යාම එම දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර, ආරක්ෂිත සහල් තොගය බෙදා හැරීමේ වැඩපිළිවෙල ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් සකස් කරනු ලැබේ.
- ආහාර කොමසාරිස් ගබඩා වෙත සපයන සහල් සඳහා මිල ගණන් පහත දක්වා ඇත.

| | |
|---|---|
| කුකුළු සුදු දිග | රු. 31.25 |
| තැම්බූ සුදු දිග | රු. 32.00 |
| රතු කැකුළු | රු. 32.75 |
| සම්බා | රු. 33.50 |

- 2004/2005 මහ කන්නයේදී රු. 15.50 හා රු. 16.50 බැගින් මිලට ගත් වී, සහල් බවට පත් කර ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු ගබඩා වලට සැපයීමේ දී එකඟ වී තිබූ මිල ගණන්, 2005/2006 මහ කන්නයේ දී රු. 16.50 හා රු. 17.50 බැගින් මිලට ගත් වී වලට අනුපාතික වශයෙන් හා වී සහල් බවට පත් කිරීමේ ප්‍රතිශතය 64% ලෙස සලකා ඉහත මිල ගණන් තීරණය කර ඇත.

- වී කෙටීම සඳහා කෙටුම් කුලී ගෙවීම පිණිස ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය යැයි තහවුරු වන අවස්ථා වලදී අත්තිකාරම් මුදලක් ලබා දීම පිණිස දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව ඉල්ලීමක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් විය යුතු වේ. මෙම අත්තිකාරම් මුදල වී මිලදී ගැනීම සඳහා සපයන ලද අත්තිකාරම් මුදල සමගම පියවිය යුතුය.

- ඉහත සඳහන් මිල ගණන් යටතේ දිස්ත්‍රික්කය තුල ඇති ගබඩාවකට සහල් ප්‍රවාහනය කිරීමේ දී රු. 1.75 ක පරිපාලන වියදම් හෝ ප්‍රවාහන වියදම් ගෙවනු නොලැබේ.

- දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටි ගබඩා වලට ප්‍රවාහනය කිරීමේ දී මෙ.ටො. 01 ක් කි.මී. 01 ක් දුර ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. 5.00 ක ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.

- අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, යන දිස්ත්‍රික්ක වල 2005/2006 මහ කන්නයේ දී මිලට ගත් වී ප්‍රමාණයෙන් 40% ක් (සහල් ආරක්ෂණ තොගය සැපයීමෙන් පසු ඉතිරිය) ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය යටතේ ඇති ගබඩා වලට සැපයීම.

- වී සැපයිය යුතු ගබඩාව පිළිබඳ විස්තර ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් සපයනු ලැබේ.

- මෙම ආරක්ෂිත වී තොගය අවශ්‍යතාවය පරිදි සහල් බවට පත් කර ගැනීමේ හා බෙදා හැරීමේ වැඩපිළිවෙල ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් සකස් කරනු ලැබේ.

- නියමිත ප්‍රමිතියෙන් යුතු වී සපයා දීම වෙනුවෙන් පෙර එකඟ වී ඇති පරිදි රු. 1.75 ක පරිපාලන දීමනාවක් වී මිලදී ගැනීමේ ආයතනයට ගෙවනු ලැබේ.

- 2005/2006 මහ කන්නයේ දී වී මිලදී ගැනීමේ කාර්යයට දායක වූ අනිකුත් දිස්ත්‍රික්ක වල ඇති වී තොග දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ සුරක්ෂිතව ගබඩා කර තිබිය යුතු අතර, එම වී සහල් බවට පත් කර සමෘද්ධි වැඩ සටහන සඳහා යෙදවිය යුතුය.

- අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, හම්බන්තොට, කුරුණෑගල හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල සමෘද්ධි අවශ්‍යතාවය සඳහා සහල් සමූපකාර සමිති වලින් සපයා ගැනීමට පියවර ගත යුතුවේ.

- සමෘද්ධි වැඩ සටහනට සපයන සහල් වල වටිනාකම ඉහත සඳහන් කර ඇති පරිදි ආහාර කොමසාරිස් වෙත සහල් සපයන මිල ගණන් අනුව ගිණුම් ගත කළ යුතුවේ.

- මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා සමෘද්ධි කොමසාරිස් ජනරාල්, සමූපකාර සංවර්ධන කොමසාරිස් හා ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරියේ නිලධාරීන් විසින් සහල් බෙදා හැරීමේ කලාප, බෙදා හරින්නන් / සපයන්නන් හා සහල් නිෂ්පාදන කලාප පදනම් කර ගත් නිශ්චිත වැඩ සටහනක් දින වකවානු සහිතව සකස් කළ යුතුය.

- ඉහත දැක්වෙන පරිදි වී සහ සහල් සපයමින් 2005/ 2006 මහ කන්නයේ වී මිලට ගැනීම සඳහා ලබා දුන් අත්තිකාරම් මුදල් පියවීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

- මෙම කන්නය තුල සහල් ප්‍රවාහනය කිරීම ඇතුළු සියළු පරිපාලන වියදම්, වියදම් ස්වරූපය අනුව වර්ගීකරණය කර ඉදිරිපත් කළ යුතු වේ.

මෙම චක්‍රලේඛයේ සඳහන් දිරි දීමනා, ප්‍රවාහන වියදම් හා වෙනත් පාඩු පියවා ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපාදන සලසා ගැනීමට අදාල පැහැදිලි කිරීම් ද සමග වන ඉල්ලීම්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ද පිටපත් සහිතව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කල යුතුය.

මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පිළිබඳව අදාල සියළු ආයතනවල නිලධාරීන් දැනුවත් කර, ඒ අනුව ක්‍රියාමාර්ග ගැනීමට ඔබගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ වැඩපිළිවෙලක් යොදන මෙන් කාරුණිකව ඉල්ලමි.

අ.ක./ එස්.බී. දිවාරත්න,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.
භාණ්ඩාගාර ලේකම් වෙනුවට

<u>පිටපත් :-</u>

1. ලේකම්, වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන අමාත්‍යාංශය.
2. ලේකම්, සමෘද්ධි හා දිළිඳුකම පිටුදැකීමේ අමාත්‍යාංශය,
3. ලේකම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය,
4. ලේකම්, කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය,
5. ලේකම්, ගොවිජන සේවා හා ගොවි ජනතාව නගා සිටුවීමේ අමාත්‍යාංශය,
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව